# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1982 පෙබරවාරි මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1982 පෙබරවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 90 යි — තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1982 පෙබරවාරි මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 35/81.

**ජාත්‍යන්තර දඹල ආයතනය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. **ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

2. (1) (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර දඹල ආයතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වූ ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ ආයතනය තත් කාලයේ 5 වන වගන්තිය යටතේ වූ මණ්ඩලයේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. **ජාත්‍යන්තර දඹල ආයතනය පිහිටුවීම.**

(2) ආයතනය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් බවට පත් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය ; තවද එහි සංස්ථාවේ නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. ආයතනයේ ප්‍රධාන කාර්යාලය මහනුවර පිහිටිය යුතු ය : එසේ වුව ද, මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව තත් කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ වෙනත් යෝග්‍ය ස්ථානයක් තෝරා ගනු ලැබිය හැකි ය. **ආයතනයේ ප්‍රධාන කාර්යාලය.**

4. ආයතනයේ පරමාර්ථ මෙසේ විය යුතු ය.— **ආයතනයේ පරමාර්ථ.**

(අ) ජාත්‍යන්තර හා ආර්ථික වටිනාකමකින් යුක්ත පශු සම්පත් ආහාර මෙන් ම මනුෂ්‍ය ආහාර මූලයක් වශයෙන් ජාත්‍යන්තරව දඹල සංවර්ධනය කිරීම හා උපයෝගී කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ම පර්යේෂණ හා සම්බන්ධිත ක්‍රියාකාරකම් නියම වශයෙන් හෝ අනියම් වශයෙන් පවත්වාගෙන යාම ;

(ආ) මිනිස් වර්ගයා වෙනුවෙන් වැදගත් වූ වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් දඹල සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කෙරෙන පර්යේෂණය, පුහුණු කිරීම හෝ වෙනත් ක්‍රියාකාරකම් සඳහා සැපවුණු මිනිස් බලය පුහුණු කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම :

(ඇ) දඹල සම්බන්ධයෙන් වූ තාක්ෂණිකය සැකසීම, වර්ධනය, උපයෝගී කර ගැනීම හා සංවර්ධනය සඳහා හේතුවන දඹල පිළිබඳව වූ තොරතුරු රැස්කර තැබීම, ව්‍යාප්ත කිරීම හා උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් වූ සියලු ක්‍රියාකාරකම්වල නිරතවීම.

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය.

5. (අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනකු විය යුතු, එනම්—

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; සහ

(ii) 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ

(ආ) (i) දඹල හා වෙනත් ඌන උපයෝගිතා පැලෑටි සංවර්ධනය කිරීම ප්‍රවර්ධනයෙහි ලා නියුක්ත වූ හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන්නා වූ; හෝ

(ii) පරිපාලනය, මුදල් හෝ නීතිය හෝ වෙනත් යම් අනුබද්ධ කාර්ය ක්ෂේත්‍රයක් පිළිබඳ පළපුරුදුකම් ඇති බව සහ හැකියාවන් ඇති බව පෙනී යන්නා වූ

තැනැත්තන් විය යුතු අනෙක් අය ඇතුළු

පහළොස් දෙනකුට වැඩි නොවන සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් මෙම ආයතනයේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

ආයතනයේ පළමුවන අධ්‍යක්ෂ මණ්ඩලය.

6. (1) (මෙහි මින්මතු "පළමුවන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුවන අධ්‍යක්ෂ මණ්ඩලය :—

(අ) (i) ශ්‍රී ලංකාවෙන්;

(ii) ලෝකයේ සංවර්ධනය වන ප්‍රදේශවලින්;

(iii) ඌන උපයෝගිතා පැලෑටි සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන ජාත්‍යන්තර සංවිධානවලින්;

(iv) ආයතනයට අරමුදල් සපයන සංවිධානවලින්; හා

(v) ආයතනයට සැලකිය යුතු අන්දමින් මුදලින් ආයක වන රටවලින්

5 වන වගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති නියමයන්ට අමතරව, මෙම ආයතනයේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති යම් ආයතනයක වැඩ සම්බන්ධයෙන් ජාත්‍යන්තර තත්ත්වයක් ඇති තැනැත්තන් විය යුතු වූ ද තෝරා ගනු ලැබිය යුතු වූ ද (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනකුගෙන් ද,

(ආ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනාගෙන්, එනම්—

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්; සහ

(ii) 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ද

සමන්විත විය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා පළමුවන මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් ඒ මණ්ඩලයේ සභාපතිවරයකු සහ උප සභාපතිවරයකු පත් කළ හැකිය.

(3) (i) සෑම පත් කළ සාමාජිකයකු විසින් ම, මිය යාම, ඉල්ලා අස් වීම හෝ ඉවත් කිරීම හේතු කොටගෙන ධුරය කලින් හිස් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(ii) නිල බලයෙන් පත්වන සාමාජිකයකු, ඒ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබුවේ යම් තනතුරක් ප්‍රකාර ද, ඔහු ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

(4) පළමුවන මණ්ඩලයේ සභාපතිවරයාගේ, උපසභාපතිවරයාගේ හෝ යම් පත් කළ සාමාජිකයකුගේ ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවක, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ එම ධුරය දැරීම සඳහා මණ්ඩලය විසින්, වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(5) රෝගාතුරවීමේ හෝ වෙනත් හේතුවක් නිසා, පළමුවන මණ්ඩලයේ සභාපතිවරයාට, උප සභාපතිවරයාට හෝ යම් පත්කළ සාමාජිකයකුට තම ධුරයේ කාර්ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වුවහොත්, සභාපතිවරයා, උප සභාපතිවරයා වශයෙන් හෝ එම සාමාජිකයා වශයෙන් ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා, මණ්ඩලය විසින් වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(6) (අ) සභාපතිවරයා විසින්, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ඒ සඳහා වූ ලිපියක් මගින් කවර වූ හෝ විටක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) පළමුවන මණ්ඩලයේ උප සභාපතිවරයා හෝ යම් පත්කළ සාමාජිකයකු විසින්, සභාපතිවරයා අමතා යවනු ලබන ඒ සඳහා වූ ලිපියක් මගින් කවර වූ හෝ විටක ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(7) මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඡන්දවල තුනෙන් දෙකකට නොඅඩු බහුතරයක් මගින්, ඒ සඳහා යම් හේතුවක් නොදක්වාම පළමුවන මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු ඉවත් කළ හැකි අතර, එවැනි ඉවත් කිරීමක් සම්බන්ධයෙන් කවර වූ හෝ අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

අතිරේක සාමාජිකයන් ගේ පත් කිරීම.

7. (1) පළමුවන මණ්ඩලය විසින් කවර වූ හෝ තැනැත්තකු අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කළ හැකි අතර, ඔහු ඒ මණ්ඩලයේ (මෙහි මින්මතු "අතිරේක සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අතිරේක සාමාජිකයකු විය යුතු ය:

එසේ වුව ද, අධ්‍යක්ෂවරයන්ගේ මුළු සංඛ්‍යාව, කවර වූ කාලයක දී හෝ මේ පනත මගින් නියමිත උපරිම සංඛ්‍යාව නොඉක්මවිය යුතු ය.

(2) සෑම අතිරේක සාමාජිකයකු විසින් ම, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතු කොටගෙන ධුරය කලින් හිස් කරනු ලැබුව හොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) යම් අතිරේක සාමාජිකයකු විසින් ධුරය හිස් කරනු ලබන විට, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරීමට වෙනත් තැනැත්තකු පළමුවන මණ්ඩලය විසින් පත් කළ හැකි ය.

(4) රෝගාතුරවීමේ හෝ වෙනත් හේතුවක් නිසා යම් අතිරේක සාමාජිකයකුට තම ධුරයේ කාර්ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වුවහොත්, පළමුවන මණ්ඩලය විසින් එම සාමාජිකයා වශයෙන් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(5) යම් අතිරේක සාමාජිකයකු විසින් මණ්ඩලයේ සභාපතිවරයා අමතා යවනු ලබන ඒ සඳහා වූ ලිපියක් මගින් කවර වූ හෝ විටක ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) පළමුවන මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඡන්දවල තුනෙන් දෙකක බහුතරයක් මගින්, ඒ සඳහා යම් හේතුවක් නොදක්වා ම යම් අතිරේක සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි අතර, එවැනි ඉවත් කිරීමක් සම්බන්ධයෙන් කවර වූ හෝ අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

පසුව එළඹෙන මණ්ඩල පත් කිරීම.

8. (1) පසුව එළඹෙන සෑම මණ්ඩලයක්ම, ඔවුන් අනුප්‍රාප්තික වන පූර්ව මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඡන්දවල තුනෙන් දෙකක බහුතරයෙන් පත් කරනු ලබන සාමාජිකයන් පහළොස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(2) පළමුවන මණ්ඩලයට අදාළ 6 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කම් සහිතව, මේ පනත යටතේ පත් කරන ලද පසුව එළඹෙන සෑම මණ්ඩලයකට ම හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීම සඳහා සුදුසුකම්.

9. මෙම පනත යටතේ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයකු නොවන්නා වූ ද, ධුරය හිස් කරන්නා වූ ද මෙම මණ්ඩලයේ යම් සාමාජිකයකුට නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් තිබිය යුතු ය.

**10.** මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට හා යම් ගාස්තු ප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන් වෙත පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය.

**11.** ආයතනයේ මුද්‍රාව—

ආයතනයේ මුද්‍රාව.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කළ හැකි ය; තව ද

(ඇ) මණ්ඩලයේ අනුමතිය සහිතව සහ තමන් පෙනී සිටි බවට සාධකයක් වශයෙන් යම් ලියවිල්ලක් අත්සන් කළ යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී විනා එම ලියවිල්ල මත නොපිහිටුවිය යුතු ය.

**12.** මණ්ඩලයේ රැස්වීම් ද ඒ සඳහා වූ ගණපූරණය සහ එම රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සෑදිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම්.

**13.** (1) මණ්ඩලය විසින් එහි බලතල, කාර්ය හෝ කර්තව්‍යයන් අතුරෙන් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍යයන් සභාපතිවරයා, විධායක කමිටුව හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරිය හැකි ය.

මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍යයන් පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය හෝ කර්තව්‍යයන් අතුරෙන් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍යයන් පවරනු ලැබූ සභාපතිවරයා, විධායක කමිටුව හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලයේ සාමාන්‍ය නියමයන්ට යටත්ව එසේ පවරනු ලැබූ බලතල, කාර්ය හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ යුතු ය.

**14.** සිය පරමාර්ථ සාක්ෂාත් කර ගනු පිණිස සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි බලතල, කාර්ය හා කර්තව්‍යයන් ආයතනය විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ යුතු අතර, විශේෂයෙන් ම—

ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍යයන්

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන්, මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදානයන්, ත්‍යාග සහ පරිත්‍යාග භාරගැනීම;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, ගැනීම හෝ දීම, බදු දීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) ආයතනයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රදානයන් උපපාදන හෝ ශිෂ්‍යත්ව දීම;

(ඈ) එහි නිලධරයන් හා සේවකයන් සම්බන්ධයෙන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම හා වසා දැමීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ එකතු කිරීම ;

(ඊ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍යයන් කිරීම පිණිස අවශ්‍ය හෝ උපකාරී හෝ ආනුෂංගික විය හැකි සියලු යම් ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට කෙළින් ම හෝ නිලධරයකු හෝ ආයතනය විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ අනුයෝජිතයකු මගින් ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(උ) මූලික වශයෙන් දඹලවලට සහ යෝග්‍ය විය හැකි පරිදි, වෙනත් ඌන උපයෝගිතා පැළෑටිවලට අදාළ පුහුණුව, අධ්‍යාපනය, ව්‍යාප්තිය හා පූර්ණ සංවර්ධන නියමාවලී පිළිබඳව සියලු අංශවලින් පර්යේෂණ පැවැත්වීම, ඒවාට සහායවීම, ඒවා සම්බන්ධීකරණය කිරීම හා දිරි ගැන්වීම ;

(ඌ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ හා උවාරණ ආනයනය කිරීම සහ ආයතනයේ කාර්යක්ෂම කාර්ය සාධනය සඳහා උවාරණ, අරමුදලක්, පිරිස් හා වෙනත් යම් සහයෝගයන් භාර ගැනීම ;

(එ) ආයතනය විසින් සලසනු ලබන යම් සේවාවන් සඳහා ගාස්තු හෝ අය භාරයන් අය කිරීම ;

(ඒ) ආයතනයට අයත් වූ හෝ ආයතනය විසින් තබා ගනු ලැබූ යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සලස්වනු ලැබීම ;

(ඔ) බෝකරන ද්‍රව්‍ය ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සහ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සඳහා ඉඩදීම ; සහ

(ඕ) ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස ආනුෂංගික හෝ උපකාර වන වෙනත් යම් ක්‍රියා සහ දේවල් සියල්ල ම කිරීම

කළ හැකි ය.

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනිකුත් නිලධරයන් පත් කිරීම.

15. (1) මණ්ඩලය විසින්—

(අ) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ; සහ

(ආ) මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු එහෙත් ආයතනයේ වැඩ සම්බන්ධයෙන් සුදුසුකම් ලැබූ තැනැත්තකු විය යුතු ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා

පත් කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්—

(අ) මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට හා තීරණවලට අනුකූලව ආයතනයේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධයෙන් වගකීම ; සහ

(ආ) තමා වෙත පවරනු ලැබිය හැකි පරිදි බලතල, කාර්ය හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම ; සහ

(ඇ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි, නිලධරයන් හා සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම

කළ යුතු ය.

(3) මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුට සහාය විය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමිකයන් ඇතුළුව සේවා නියුක්තියේ කොන්දේසි මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට පත්කිරීම් සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

16. මෙම පනතේ අනෙක් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්—

(අ) ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ එම කාර්ය මණ්ඩලය විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඈ) එම කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හා යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ ඒ සඳහා දායක මුදල් ගෙවීම.

යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත්වීමෙහි දෝෂයක් නිසා මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස නොසැලකිය යුතු බව.

17. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබූ පමණින් නැතහොත් මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ පත්වීමෙහි දෝෂයක් තිබූ පමණින් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍යයන්.

18. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ යුතු ය :—

(අ) ආයතනයේ ප්‍රතිපත්ති සාධක මණ්ඩලය වශයෙන් ක්‍රියා කිරීම සහ ප්‍රතිපත්තිමය වශයෙන් එහි ප්‍රධාන නියමාවලීන් සම්පාදනය කිරීම හෝ අනුමත කිරීම ;

(ආ) ආයතනයේ අය වැය අනුමත කිරීම සහ මුදල් තත්ත්වය සමාලෝචනය කිරීම ;

(ඇ) ආයතනයේ පරිපාලනය සඳහා අරමුදල් ලබා ගැනීම සහ ආයතනය පවත්වාගෙන යාම සඳහා විදේශීය මෙන් ම දේශීය සංවිධානවලින් ද මුදල් ආධාර භාර ගැනීම ;

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ආයතනයේ යම් ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීම හා අගැයීම ;

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ කමිටු අතුරෙන් යම් කමිටුවක් වෙත සිය බලතල, කාර්ය හා කර්තව්‍යයන් අතුරෙන් යම් බලතල, කාර්ය හා කර්තව්‍යයන් පැවරීම ; හා

(ඊ) ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු යම් ක්‍රියා මාර්ග ගැනීම.

රීති සෑදීමට මණ්ඩලය සතු බලය.

19. මේ පනත යටතේ රීති සෑදීමට බලය දෙනු ලැබ ඇති හෝ නියම කරනු ලැබ ඇති සියලු කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

කමිටු පත් කිරීමට මණ්ඩලයට ඇති බලය.

20. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කාරණා අතුරෙන් යම් කාරණයක් හෝ ඒ කාරණා සියල්ල සම්බන්ධයෙන් මණ්ඩලයට සහායවීම මෙන් ම එහි බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා මණ්ඩලයට සහායවීමේ සහ උපදෙස් දීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි විධායක කමිටුවක්, කාර්මික උපදේශක කමිටුවක් හා එවැනි වෙනත් කමිටු මණ්ඩලය විසින් පත් කළ හැකි ය.

(2) කාර්මික උපදේශක කමිටුව විසින්, මණ්ඩලයේ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සාමාන්‍ය වශයෙන් මණ්ඩලයට සහාය වීම ද මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාත්මක කිරීම හා ක්‍රියාවේ යෙදවීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම ද කළ යුතු ය.

(3) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිල බලයෙන් කාර්මික උපදේශක කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර විධායක කමිටුවේ සාමාජිකයකු ද විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ පිහිටුවනු ලබන සෑම කමිටුවකම ධුර කාලය හා නිශ්චිත බලතල, කාර්ය හා කර්තව්‍යයන් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, කමිටුවේ රැස්වීම්වල ගණපූරණය ඇතුළුව ඒ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

**21.** (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් තිබිය යුතු අතර, එය ආයතනය විසින් පවත්වාගෙන යා යුතු ය. ආයතනයේ අරමුදල.

(2) (අ) ආයතනය පිහිටුවීම සඳහා අදාළ වන්නා වූ පරිදි සංවිධාන විසින් සපයනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් ආදායම්, ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානයන් වශයෙන් ආයතනයට ලැබිය හැකි සියලු මුදල්

ආයතනයේ අරමුදලට ගෙවිය යුතු ය.

(3) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සම්බන්ධයෙන් ආයතනය විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලුම මුදල් ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු ය.

**22.** ආයතනයේ අරමුදලින් යම් මුදල් ආපසු ගැනීමේ සහ අරමුදලේ යම් මුදල් ආයෝජනය කිරීමේ පිළිවෙළ හා ආකාරය තත් කාර්යය සඳහා කලින් කල සාදනු ලබන යම් රීතිවලට අනුව මණ්ඩලය විසින් කළ යුතු අතර, ඒ රීති අනුව හැර කිසිම මුදලක් ආපසු නොගත යුතු ය. අරමුදලේ මුදල් ආපසු ගැනීම හා ආයෝජනය කිරීම.

**23.** (1) (අ) නිදහස් කිරීමක් නොමැති වූයේ නම්, යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් අය කළ හැකි තීරු බද්දකට ආයතනය යටත් වන්නා වූ ආයතනය විසින් හෝ ආයතනය වෙනුවෙන් හෝ ආයතනයේ නමින් ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් පිළිබඳ වූ යම් මුද්දර ගාස්තුවක් ; ආයතනය බදු ගෙවීමෙන් නිදහස් විය යුතු බව.

(ආ) ආයතනය විසින් ආනයනය කරනු ලැබූ යම් භාණ්ඩ, වාහන, යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ ආයතනයේ පරමාර්ථ දියුණු කිරීම සඳහා උපකාර වේ යයි අමාත්‍යවරයා සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සලකනු ලැබුව හොත්, ඒ භාණ්ඩ, වාහන, යන්ත්‍රාගාර හෝ යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම සඳහා රේගු බද්දක් ;

(ඇ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ධන බද්දක් ; සහ

(ඈ) අවස්ථාවෝචිත පරිදි, 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත, මහා නගර සභා ආඥාපනත හෝ නගර සභා ආඥාපනත යටතේ වූ යම් ගාස්තු හෝ බදු

ගෙවීමෙන් ආයතනය නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන ආයතනයේ යම් සේවා නියුක්තයකු විසින්—

(අ) ස්වකීය පුද්ගලික පාවිච්චිය සඳහා ගෙන්වනු ලැබූ යම් භාණ්ඩ හෝ වාහන සම්බන්ධයෙන් රේගු බදු ගෙවීමෙන් ; සහ

(ආ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් හෝ ධන බද්දෙන්

ඔහු නිදහස් කරනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

24. (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(2) මණ්ඩලය විසින් ආයතනයේ ආදායම හා වියදම, වත්කම් හා වගකීම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) මණ්ඩලය විසින් පත් කරනු ලැබූ සුදුසුකම් ලත් විගණක වරයන් විසින් ආයතනයේ ගිණුම් විගණනය කළ යුතු ය.

(4) ආයතනයේ විගණකවරයන්ගේ පාරිශ්‍රමිකයන් මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

ආණ්ඩුව විසින් ආයතනයේ පාවිච්චිය සඳහා පරිශ්‍රයන් සපයා දිය යුතු බව.

25. ආණ්ඩුව විසින්, අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි යම් ඉඩම්, ගොඩනැගිලි හා වෙනත් යම් පහසුකම් ආයතනයේ පාවිච්චිය සඳහා සැපයිය හැකි ය.

මණ්ඩලයේ නියමයක් මත මේ පනත යටතේ කරනු ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

26. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) ආයතනයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානයන් මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ කවර වූ හෝ අධිකරණයක පවරන ලද කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තුවක් අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියා

වක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කවර වූ හෝ අධිකරණයක පවරන ලද එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරණ ලද යම් වියදමක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කළහොත් ඒ වියදම එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කර නොගන්නා ලද නම්, ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ට හෝ ආයතනයේ නිලධරයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඒ සාමාජිකයන්ගේ හෝ නිලධරයාගේ දේපළට විරුද්ධව කිසිම සිවිල් ආඥාවක් නොතිබිය යුතු බව.

**27.** ආයතනයට විරුද්ධව පවරනු ලැබූ කවර හෝ නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ ආයතනයේ යම් නිලධරය කුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔවුන්ගේ දේපළට විරුද්ධව කිසිම සිවිල් ආඥාවක් නොතිබිය යුතු ය.

ආයතනය විසුරුවා හැරීම.

**28.** (1) ආයතනය විසුරුවා හැරිය යුතු යයි මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, මණ්ඩලය විසින්, එහි සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක් විසින් සම්මත කරනු ලබන යෝජනා සම්මතයක් මගින්, ආයතනය විසුරුවා හැරීමට තීරණය කරනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින්, මණ්ඩලය විසින් කරන ලද එවැනි යම් තීරණයක් මත, ආයතනය විසුරුවා හැරීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කිරීම ද, ආයතනයේ ඈවරකරු හෝ ඈවරකරුවන් වශයෙන් එක් තැනැත්තකු හෝ තැනැත් තන් වැඩි ගණනක් පත් කිරීම ද, කරනු ලැබිය හැකි ය.

(3) 1971 අංක 38 දරන මුදල් පනතේ 20 වන හා 21 වන වගන්තිවල විධිවිධාන, එවිට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනය ඈවර කිරීමට අදාළ විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.